# ගුරුළුගෝමීන්ගේ හා විද්‍යා චක්‍රවර්තීන්ගේ භාෂා රීතිය

**බෝලියද්දේ ධම්මකුසල හිමි**

අනුරාධපුරයෙන් ආරම්භවූ සිංහල ගද්‍ය සාහිත්‍යය පොළොන්නරු යුගයේ දී දියුණුවට පත් වන අයුරු විද්‍යමාන සාහිත්‍ය කෘති මගින් පැහැදිලිව අධ්‍යයනය කළ හැකිය. ගුරුළුගෝමී පඬිවරයා විසින් රචනා කරන ලද ධර්මප්‍රදීපිකාව හා අමාවතුරත්, විද්‍යාචක්‍රවර්තීන් විසින් රචනා කරන ලද බුත්සරණත් යන සාහිත්‍ය නිර්මාණ මේ සඳහා සාධක වේ. අනුරාධපුර යුගයේ මුල් අවධියේ සිට නිර්මාණාත්මක වශයෙන් අගය කළ හැකි ගද්‍ය සාහිත්‍ය කෘති පැවති බවට ඓතිහාසික සාධක හමුවුවත් අද වන විට ඒවා විද්‍යමාන නොවන හෙයින් සිංහල සාහිත්‍යයේ මුල්ම නිර්මාණාත්මක ගද්‍ය කෘති ලෙස ගුරුළුගෝමීන් විසින් රචනා කරන ලද ධර්මප්‍රදීපිකාව හා අමාවතුරත් විද්‍යාචක්‍රවර්තීන් විසින් රචනා කරන ලද බුත්සරණත් පිළිගැනෙයි. විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණ පොළොන්නරු යුගයේ අග භාගයේ දී පමණ රචනා කරන ලද බව විද්වත් පිළිගැනීමයි.



කෙසේවුවත් පොළොන්නරු යුගයේ සිංහල සාහිත්‍යයේ ප්‍රධානම ගද්‍ය රචකයන් දෙදෙනා ලෙස ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් පිළිගැනීමට ලක් වෙයි.

සිංහල ගද්‍ය සාහිත්‍යයේ පැරණිම ගද්‍ය ග්‍රන්ථය හෙවත් ගුරුළුගෝමීන් විසින් රචිත මුල්ම ග්‍රන්ථය ධර්මප්‍රදීපිකාවයි. ඇතැම් විද්වත්හු ගුරුළුගෝමීන්ගේ මුල් ග්‍රන්ථය ලෙස අමාවතුර සැලකුව ද අමාවතුර ග්‍රන්ථයේ සඳහන් තොරතුරු අනුව ධර්මප්‍රදීපිකාව මුලින්ම රචනා කෙරුණු බව හඳුනගත හැකිය.

''ඔවුන් සැගිරි යැ කළුතිඹිරිරුක්මුල්හි කාලකාරාමසුත දෙසූ දවස් රජු විසින් සියක් යොදුන් ලක්දිවැ රජයෙන් පුදන ලද පරිදි ධර්මප්‍රදීපිකායෙහි (4 අංශය, 46 පිටුව) කී පරිද්දෙන් දත තයුතු.''[1]

කතුවරයා සම්මත කථා පුවත අවසානයේ කරන මෙම සටහනින් ධර්මප්‍රදීපිකාව මුලින් රචනා කරන ලද බව පිළිගැනීමට සිදු වේ. ගුරුළුගෝමීන් විසින් රචිත ධර්මප්‍රදීපිකාව හා අමාවතුර ග්‍රන්ථවලට අමතරව බුත්සරණ ද පෙළෝන්නරු යුගයේ රචිත උසස් සිංහල ගද්‍ය සාහිත්‍යය ග්‍රන්ථයකි. බුත්සරණ විද්‍යාචක්‍රවර්තීන් විසින් රචනා කරන ලද බව ''විද්‍යාචක්‍රවර්තීන් විසින් කළ අමෘතාවහ නම් බුද්ධචරිතය නිමි.''[2] යන ග්‍රන්ථාවසානයේ සඳහන් පාඨයෙන් පැහැදිලි වේ.

බුත්සරණ රචනා කරන ලද යුගය පිළිබඳ විද්වතුන් අතර විවිධ මත පවතියි. පුංචිබණ්ඩාර සන්නස්ගලට අනුව බුත්සරණ රචනා වී ඇත්තේ දඹදෙණි යුගයේ ය. බුත්සරණ සංස්කරණය කරන වැලිවිටියේ සෝරත හිමියන්ගේ අදහස වන්නේ බුත්සරණ පොළොන්නරු යුගයට අයත් ගද්‍ය කෘතියක් බවයි. බුත්සරණෙහි පිළිබිඹු වන භක්ති කාව්‍ය ලක්ෂණ පිළිබඳ ශාස්ත්‍රීය නිබන්ධයක් රචනා කරමින් මහාචාර්ය පියසීලි විජේමාන්න මහත්මිය සඳහන් කරන්නේ ද භාෂා ලක්ෂණ අනුව බුත්සරණ පොළොන්නරු යුගයේ අවසාන කාලයට අයත් බවයි. ග්‍රන්ථයේ භාෂාව විමසා බලන විට බුත්සරණ ලියවෙන්නට ඇත්තේ 12 වන ශත වර්ෂයේ අවසානයේ හෝ 13 වන ශත වර්ෂයේ මුල් දශකවල දී බව පැහැදිලිය.

බුද්ධ චරිතය විග්‍රහ කරමින් ජන හදවත් තුළ බුද්ධ භක්තිය ඉස්මතු කිරීම බුත්සරණ රචනා කිරීමේ මූලික අරමුණ වූ බව ග්‍රන්ථාවසානයේ සඳහන් 'විද්‍යාචක්‍රවර්තීන් විසින් කළ අමෘතාවහ නම් බුද්ධචරිතය නිමි'[3] යන පාඨයෙන් වඩාත් හොඳින් වැටහෙයි. සෑම ඡේදයක් අවසානයේ දී ම කතුවරයා කරන ප්‍රකාශයෙන් එය වඩාත් තහවුරු වේ.

"බුත්සරණ යෙමි යි බුත්සරණ යා යුතුයි"[4]
"මහතානන් සරණ යෙමි යි බුදුන් සරණ යා යුතු"[5]
"හිමියානන් සරණ යෙමි යි බුදුන් සරණ යා යුතු"[6]
"මහපුරුෂයානන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු"[7]
යන වැකි පරීක්ෂා කිරීමෙන් එය පැහැදිලි වෙයි.



හින්දු ආගමේ දැඩි බලපෑම නිසාම බුද්ධ භක්තිය යටපත්ව දේව භක්තිය ඉස්මතු වූ පොළොන්නරු යුගයේ දේශපාලනික සාමාජීය මෙන් ම විශේෂයෙන් ආගමික පරිසරය අනුව බුද්ධ භක්තිය ඉස්මතු කිරීම යුගයේ අවශ්‍යතාවක් වූ අතර පොළොන්නරු යුගයේ ලියවෙන සෑම ගද්‍ය සාහිත්‍යයකම පාහේ එම අරමුණ ඇතිව රචනා කරන ලද බව විද්‍යමාන වෙයි. හින්දු දේව භක්තිය ප්‍රබලව ඉස්මතු වූ පොළොන්නරු යුගයේ දී බුද්ධ භක්තිය සාහිත්‍ය කෘතිවලට තේමා කර ගැනීම යුගාවේණික ලක්ෂණයක් විය.

ධර්මප්‍රදීපිකාව රචනා කරන ගුරුළුගෝමීන්ගේ ග්‍රන්ථ පරමාර්ථය වූයේ බුදුන්වහන්සේගේ අප්‍රමාණ වූ ගුණ වර්ණනා කිරීම යි. ඔහුගේ දෙවන ගද්‍ය කෘතිය සේ සැලකෙන අමාවතුර විෂම පුරුෂයන් දමා අමාමහ නිවන් සාදවා දුන් බුදුන්ගේ ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු කිරීම අරමුණු කරගෙන රචනා කෙරෙයි. විද්වතුන්ගේ මත හා ග්‍රන්ථ රචනා කිරීමේ අරමුණු විග්‍රහ කර බලන විට ගුරුළුගෝමීන් විසින් රචිත ධර්මප්‍රදීපිකාව හා අමාවතුර මෙන් ම විද්‍යාචක්‍රවර්තීන් රචනා කළ බුත්සරණ ද පොළොන්නරු යුගයේ රචනා වූයේ යැයි පිළිගැනීම සාධාරණ වෙයි.

ධර්මප්‍රදීපිකාව පාලි බෝධිවංශයට කෙරෙන පරිකතාවක ස්වරූපයෙන් රචනා කර තිබේ. බෝධියවංශය මුල් කර ගෙන රචිත ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව පරිකතාවක් පමණක්ම නොව සිංහල ගද්‍ය සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙසත් ධර්ම ග්‍රන්ථයක් ලෙසත් විද්වතුන්ගේ සම්භාවනාවට

පාත්‍ර වෙයි. මෙහි තේමාව හෙවත් වස්තු විෂය වන්නේ ජය ශ්‍රී මහා බෝධිය, තත්ප්‍රභව වූ ඵලරුක් මහාබෝධි හා තදවයව වූ ශාඛා මහා බෝධි යන තුන් බෝධීන්ය.

"මහවීර්ය කොට බොධි පයඊඩකාරූඪ වැ මාරවිජය කොට සර්වඥපදප්‍රාප්ත වැ හුනස්නෙන් නැගී පූර්වොත්තදේශාභාගයෙහි වැඩ සිට සප්තාහයක් අනිමිෂ ලෝචන යුගලයෙන් පුදන ලද ජයමහබෝධි යැ, තත්ප්‍රභව වූ ඵලරුහ මහාබෝධි යැ, තදවයව වූ ශාඛා මහා බෝධි යැ යන තුන් බෝධීන්ගේ වංශයෙන් සහස්‍රරශ්මීන් විභක්ත පදයන් අතුරෙහි"[8]

ධර්මප්‍රදීපිකාවෙන් ධර්මය පිළිබඳ විස්තර කරන ගුරුළුගෝමීහු බුද්ධ චරිතයට සම්බන්ධ කථා පුවත් තෝරාගෙන අනන්තාපරිමාණ බුදු ගුණ වැනීමට බුද්ධ චරිත කෘතියක් ලෙස අමාවතුර රචනා කළහ. ගුරුළුගෝමීන් විසින් රචිත ධර්මප්‍රදීපිකාව පසුව රචනා කළ අමාවතුර සමඟ සසඳමින් "හේ බුද්ධ ධර්මය යැ මේ බුද්ධ චරිතය යැ" යනුවෙන් සඳහන් කරයි. අමාවතුර කෘතිය ආරම්භයේ දීම ග්‍රන්ථය රචනා කිරීමේ කතුවරයාගේ තේමාව හෙවත් වස්තු විෂය ඉතා සංක්ෂිප්තව හා පැහැදිලිව ගෙනහැර දක්වයි.

"බුදුගුණ අනන්ත වන බැවින් නවගුණ හැම කියත් නොපිළිවතින් එහි "පුරිසදම්මසාරථී" යන පදය ගෙණැ..."[9]

අන්තාපරිමාණ වූ නව අරහාදී බුදු ගුණයන් අතුරින් පුරුෂදම්මසාරථී ගුණය පමණක් ගෙන දෙව්, මිනිස්, යක්ෂ, තිරිසන් ආදී වූ විවිධ විෂම පුරුෂයන් දමනය කොට අමාමහ නිවන්හි පිහිටවූ කථා ප්‍රවෘත්ති යොදා ගෙන බුදුන්ගේ ගුණ වර්ණනා කරයි. බුත්සරණ රචනා කිරීමේ දී ද ගුරුළුගෝමීන් මෙන් විද්‍යාචක්‍රවර්තීන් ද සිය තේමාව හෙවත් වස්තු විෂය තෝරාගෙන පොදු ජනයා තුළ බුද්ධ භක්තිය දනවිය හැකි ත්‍රිපිටක අට්ඨකථා ආදී ග්‍රන්ථයන්හි කථා පුවත් ග්‍රන්ථ රචනයේ දී යොදා ගැනෙයි.



"විද්‍යාචක්‍රවර්තීන් විසින් කළ අමෘතාවහ නම් බුද්ධ චරිතය නිමි"[10]

යන පාඨය විග්‍රහ කිරීමෙන් පැහැදිලි වන්නේ විශේෂයෙන් අමාවතුර කෘතියට සමාන තේමාවක් හා වස්තු විෂයක් බුත්සරණ කතුවරයාද යොදා ගත් බවයි. ගුරුළුගෝමීන් මෙන්ම විද්‍යාචක්‍රවර්තීන් ද තමන් ග්‍රන්ථය රචනා කරන්නේ කිනම් ග්‍රාහක පිරිසකට ද යන්න පිළිබඳව මනා වැටහීමක් පැවති බව ග්‍රන්ථය අධ්‍යයනය කරන විට පැහැදිලි වෙයි. ධර්මප්‍රදීපිකාව රචනා කරන ගුරුළුගෝමීන් ඔහුගේ ග්‍රාහක පිරිස බවට පත්වන්නේ ශද්ධා බුද්ධි සම්පන්න ජනයා බව ප්‍රකාශ කරයි. අමාවතුර කෘතිය රචනා කරන ගුරුළුගෝමීහු ආරම්භයේ දී ම සිය ග්‍රාහක පිරිස පිළිබඳව සටහන් කළහ.

"නොවියත් හුදීජනන් සඳහා සියබසින් මා විසින් සැබෙවින් දක්වනු ලැබේ"[11]

ඉහත පාඨය අනුව අමාවතුර රචනා කරන්නේ නොවියත් හුදී ජනයා අරමුණු කරගෙනයි. පී.බී. සන්නස්ගල මහතා නොවියත් හුදී ජනයා යනුවෙන් පාලි ධර්මය නොදත් ජනයා අදහස් කරන්නට ඇතැයි ප්‍රකාශ කරයි.[12] බුත්සරණ රචනා කළ විද්‍යාචක්‍රවර්ති පැහැදිලිව හඳුනාගත හැකි පිරිසක් සිය ග්‍රාහක පිරිස ලෙස තෝරා ගත් බවක් නොපෙනෙයි. පළමු පරිච්ඡේදය කියවන විට ලෞකික හා ලෝකෝත්තර සැප කැමති සියලු දෙනා බුත්සරණේ ග්‍රාහක පිරිස බවට පත්වූ බව පැහැදිලි වෙයි.

සිංහල ගද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ අතර පොළොන්නරු යුගයේ ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව හා අමාවතුරත් විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණත් විද්වතුන්ගේ නොමඳ ගෞරවාදරයට පාත්‍ර වූ හා පාත්‍රවන සිංහල ගද්‍ය ග්‍රන්ථ ලෙස හඳුනාගත හැකිය. ග්‍රන්ථ රචනා කිරීමේ දී සිය මූලික අරමුණට සාපේක්ෂව වස්තු විෂය තෝරා ගැනීම, විවිධ රචනා උපක්‍රම භාවිතා කිරීම, උචිත භාෂා රීතියක් හෝ රීතීන් යොදා ගැනීම ආදී සෑම අතින්ම ඔවුනොවුන්ට ආවේණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ගද්‍ය කරණයේ යෙදුණු රචකයන් දෙදෙනෙකු ලෙස ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් හඳුන්වා දිය හැකි ය. විශේෂයෙන් ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් විසින් සිංහල ගද්‍ය ග්‍රන්ථ රචනයේ දී අනුගමනය කෙරුණු භාෂා රීති අධ්‍යානය කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වේ.

ඕනෑම සාහිත්‍යය කෘතියක් නිර්මාණය වන්නේ භාෂාව උපයෝගී කරගෙන ය. සමාජයක ඒ ඒ යුගයන්හි



පැවති භාෂාව අධ්‍යයනය කිරීමේ දී සමකාලීන සාහිත්‍ය කෘති යොදාගැනීම එම අධ්‍යයනය වඩා පහසු කරවයි. පොළොන්නරු යුගයේ සිංහල භාෂා ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. ඒ අනුව පොදුවේ එම යුගයේ පැවති භාෂා ලක්ෂණ ද සැලකිල්ලට ගනිමින් ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් ගද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ රචනා කිරීමේ දී භාවිත කළ භාෂා රීති අධ්‍යයනය කිරීම සිංහල සාහිත්‍ය අධ්‍යයනයනටත් භාෂා ඉතිහාසයටත් වැදගත් වෙයි.

ගද්‍ය සාහිත්‍යය ආරම්භක අවධියේම බුද්ධ චරිතය හෝ බුද්ධ ධර්මය කේන්ද්‍ර කර ගනිමින් මෙරට සිංහල ගද්‍ය සාහිත්‍යය ගොඩනැගූ අයුරු ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව හා අමාවතුරත් විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණත් අධ්‍යයනය කිරීමෙන් වැටහේ. ඔවුන් ගද්‍යකරණයේ දී පෑ විශිෂ්ටත්වය අවබෝධ කර ගැනීමට ඇති එක් අංගයක් වන්නේ ඔවුන් සතුව පැවති භාෂා ඥානයත් එම භාෂාව රමණීය ලෙස හා විදග්ධ ලෙස සිය නිර්මාණයන් සඳහා යොදා ගත් ආකාරයත් අධ්‍යයනය කිරීමයි.

පොළොන්නරු යුගයේ භාෂා සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනයේ දී බහුල වශයෙන් සංස්කෘත භාෂාවේ ආභාසය විද්‍යමාන විය. පොළොන්නරු කතිකාවත ආදී සෙල් ලිපිවලින් පැහැදිලි වන්නේ සංස්කෘත තත්සම භාෂාවට බහුල වශයෙන් මේ යුගයේ නැඹුරුව සිටි බවයි. පොළොන්නරු

ගද්‍ය ග්‍රන්ථ රචනා කිරීම සඳහා ගුරුළුගෝමීන් යොදා ගත් භාෂාව පිළිබඳ පී.බී. සන්නස්ගලගේ අදහස වන්නේ හෙළු වහර, සකු වහර හා හෙළු මුසු සකු වහර ධර්මප්‍රදීපිකාව රචනා කිරීමේ දී යොදා ගත් බවයි.

"හෙළු වහර, සකු වහර හා හෙළු මුසු සකු වහර ඔහුගේ රචනා ශෛලියේ විනිවිද පෙනේ. එය ඇතැම් විටක එකම වාක්‍යයක ද සමහර විට වෙන් වෙන් වාක්‍යවල දැකිය හැකියි.''[16]

ගුරුළුගෝමීහු ගද්‍ය රචනයේ දී භාෂා ප්‍රස්තාර කීපයක් යොදා ගත් බව මින් පැහැදිලි වෙයි. ධර්මප්‍රදීපිකාව රචනා කිරීමේ දී බුදුගුණ වර්ණනය සඳහා සංස්කෘත තත්සම වචන භාවිත කිරීම කැපී පෙනෙයි. උදාහරණයක් ලෙස සම්‍යක් සම්බුද්ධ නම් බුදු ගුණය කතුවරයා මෙසේ වර්ණනා කිරීම ආරම්භ කරයි.

"සර්වධර්මයන් සර්වාකාරයෙන් පරොපදෙශරහිතවැ ස්වයම්භූත ඥානයෙන් නිරවශෙෂ කොට අවගමනය කළ බැවින් ''සම්‍යක් සම්බුද්ධ'' නම් වේ.''[17]

ඇතැම් විට කරුණු විස්තර කිරීමේ දී සංස්කෘත ශ්ලෝක පවා යොදා ගැනීම ධර්මප්‍රදීපිකාවේ දැකිය හැකි ලක්ෂණයකි. භාග්‍යවාන් යී කියමනා තැන්හි නෛරුක්තිකවිධි භගවාන් යනු යැයි දක්වන කතුවරයා,



නෛරුක්තිකවිධි නම් කවරේදැයි තව දුරටත් විස්තර කිරීමට ඒ සඳහා සංස්කෘත ශ්ලෝකයන් යොදා ගනියි.

"වාර්ණණාගථො විර්ණණවිර්යයයශ්ච
ද්වෞ චාපරෞ වර්ණණවිකාරගාශෞ
ධාතොස්ත දර්ථාතිශයෙන යොග
ස්තදුච්‍යතේ පඤ්චවිධං නිරුක්තම්"[18]

මෙමගින් කතුවරයා සතු වූ සංස්කෘත භාෂාව පිළිබඳ විශාරද දැනුම පිළිබිඹු වෙයි. සංස්කෘත භාෂාවට පොළොන්නරු යුගයේ දී ඉහළ පිළිගැනීමක් පැවති බවට හා සිංහල භාෂාවට සංස්කෘතයේ ප්‍රබල බලපෑමක් එල්ලව පැවති බවට මෙය සාධක වෙයි.

ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව පුරාවට සංස්කෘත භාෂාව යොදා ගැනුණ ද සංස්කෘත බහුල හෙළ වදන් ධර්මප්‍රදීපිකාවේ ප්‍රධාන භාෂා ප්‍රස්තරයයි. කර්ම විෂය අචින්ත්‍ය පරිදි කියේ දැයි විස්තර කරන තැන කතුවරයා යොදාගත් මෙම භාෂා ලක්ෂණ අධ්‍යයනය හැකි එක් අවස්ථාවකි.

"කුශලාකුශලකර්මයන් කෙරෙහි එකකර්මොපබෘහිත සත්‍වයන් කෙරෙන් එකෙක් මනුෂ්‍යයන් කෙරෙහි උපද්දිඃ එකෙක් චාතුර්මහාරාජිකාදී තත්තත් ස්ථානයෙහි උපද්දි. එහි දු එම කර්මයෙන් උපන් සතුන් කෙරෙහි එකෙක් දුර්වර්ණ වෙයිඃ එකෙක් සුවර්ණ වෙයි.ඃ එකෙක් දීර්ඝ වෙයිඃ එකෙක් හ්‍රස්ව වෙයිඃ එකෙක් අල්පෙශාක්‍ය වෙයිඃ එකෙක් මහෙශාක්‍ය වෙයිඃ මෙසේ සත්‍වයෝ අනෙකස්වභාව භින්න වෙතිඃ

අකුශලකර්මයෙහි දු එසේම යැ: මෙසෙයින් කර්මවිෂය අචින්ත්‍ය වේ.''[19]

මෙලෙස සංස්කෘත වදන් බහුල හෙළ වහර බොහෝ අවස්ථාවල දී ගුරුළුගෝමීහු යොදා ගත්හ.

පරිකථාවක් සේ රචිත ධර්මප්‍රදීපිකාව රචනයේ දී කතුවරයා සූත්‍රාගත පාලි පාඨ සිය කරුණු සනාථ කිරීමට යොදා ගනියි. බුදු ගුණ වර්ණනා කිරීමේ දී පවා පාලි පාඨ යොදා ගැනීම ධර්මප්‍රදීපිකාවේ ප්‍රමුඛ ලක්ෂණයකි. එය ධර්මප්‍රදීපිකා භාෂාවේ තවත් ලක්ෂණයක් ලෙස හඳුනා ගැනීමට පිළිවන. අභිසම්බෝධි කථාවේ දී ලෝක විෂය අචින්ත්‍යය. කෙසේ දැයි පාලි පාඨයන්ගෙන්ම කතුවරයා පැහැදිලි කර දෙයි.

''චත්තාරිමානි භික්ඛවෙ අචින්තියානි න චින්තෙතබ්බා නි යානි චින්තෙන්තා උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස කතමානිචත්තාරි? බුද්ධානං භික්ඛවෙ බුද්ධවිසයො අචින්තියො න එතෙන තබ්බො යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්සඃ ඣායිස්ස භික්ඛවේ අචින්තියො න චින්තෙබ්බා...''[20]

ඇතැම් තැනෙක පාලි පාඨ බහුල වශයෙන් යොදාගෙන විස්තර කථන සැපයීම දැකිය හැකිය. ධර්මප්‍රදීපිකාවේ විද්‍යමාන මෙම භාෂා ලක්ෂණ තුළින් සංස්කෘත භාෂාව හා හෙළ භාෂාවේ පමණක් නොව



ගුරුළුගෝමීන් සතු පාලි භාෂාව පිළිබඳ පාණ්ඩිත්‍යය ද පිළිබිඹු කරයි.

ධර්මප්‍රදීපිකාවේ ඇතැම් තැනෙක නුමුසු හෙළ වහර භාවිත කිරීම විශේෂත්වයකි. ධර්මප්‍රදීපිකාවේ එන සුළුකලිඟුදා වත ඒ සඳහා උදාහරණ වෙයි. ගුරුළුගෝමීන් විසින් නුමුසු හෙළ වදන් භාවිත කරමින් චමත්කාරජනක වර්ණනාවලින් යුක්තව සුළුකලිඟුදා පුවත විස්තර කරයි. ඇතැම් විට කතුවරයා සතු වදන් භාවිත කළ ද ඒ ගැන පාඨකයාගේ අවධානය යොමු නොවන පරිදි නුමුසු හෙළ වහර මෙහි යොදා ගැනෙයි. සුළුකලිඟුදා පුවතෙහි එන මදුරට දියණිය හා සුළු කළිඟු කුමරු මුණගස්වා ගුරුළුගෝමි සිදු කරන සම්භෝග ශෘංගාර රසාලිප්ත වර්ණනාව මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැක.

''එකල්හි නන්කුසුම්රෙජෙන් ලොවි තරවමින් කෙවුලන් කුල්වමින් මත්මොනරගනා පිලඹරා කෙකා ගන්වමින් වෙහෙල් මියුල්ගණා මනදොළ පුරමින් ගඳ ගජන් දෙ කරවමින් මල් පල්ලෙන් සා මඬුලු සාදමින් බමරකැල ගුම්ගන්වමින් වනවිල්හි තිසර උරගසින් බුන් රළසැකින් පුල්මහනෙල් ගල්වමින් පියුම් තඹුරු වෙනෙහි රොන් උදහවමින් සපුසළලසල් වෙනෙහි බිඟුමුමන ගන්වමින්...''[21]

නුමුසු හෙළ වහර යොදාගෙන සුළුකලිඟුදා පුවත රචනා කිරීමට කතුවරයා උත්සාහ කළ ද දුර්ලභ වශයෙන් සංස්කෘත තත්සම වචන ඒ තුළට ද මිශ්‍ර වී තිබීමෙන්

පොළොන්නරු යුගයේ සංස්කෘත භාෂාවේ දැඩි බලපෑම කැපී පෙනෙයි.

සංස්කෘතයට වහල් නොවී සිය බසින් හෙවත් දේශීය බසින් ලියූ ග්‍රන්ථයක් ලෙස ගුරුළුගෝමීන් විසින් රචිත අමාවතුර හඳුන්වා දිය හැකිය. ග්‍රන්ථය ආරම්භයේ ම කතුවරයා ග්‍රන්ථය රචනා කරන භාෂා රීතිය පිළිබඳ සටහන් කරයි.

"... නොවියත් හුදී ජනයන් සඳහා සියබසින් ම විසින් සැබෙවින් දක්වනු ලැබේ."[22]

කතුවරයාගේ අරමුණ වන්නේ සියබසින් හෙවත් තමන්ගේ භාෂාවෙන් ග්‍රන්ථය රචනා කිරීමයි. එසේ නම් අමාවතුර රචනයට කතුවරයා යොදා ගැනීමට අපේක්ෂා කරන්නේ දේශීය භාෂාවයි. එහි දී අනෙකුත් ග්‍රන්ථයන්වල මෙන් නොව අමාවතුර රචනා කිරීමේ දී සියබස ද සැකෙවින් යොදා ගැනෙයි. අමාවතුර කතුවරයා මෙලෙස 'සියබස' ලෙස හඳුන්වන්නට ඇත්තේ අමාවතුර රචනයේ දී බහුල වශයෙන් යොදා ගත් හෙළ වහර යැයි උපකල්පනය කළ හැකිය. පී.බී. සන්නස්ගල ප්‍රකාශකරන්නේ අමාවතුර රචනා කරන ගුරුළුගෝමීහු ඉතා දක්ෂව හෙළ වහර භාවිත කරන බවයි.

"පොතේ මේ තතු විමසන විට, අදහස් පැවසීමෙහි ගුරුළුගෝමීන් හෙළුව කොතරම් දක්ෂව යොදා ඇත්ද යනු දක්නට පුළුවන. හෙළුවහරේ අර්ථ ශක්තියේ තියුණු තරම පිරික්සිය යුතු නම් බැලිය යුත්තේ ගුරුළුගෝමීන්ගේ අමාවතුරෙහි එන හෙළුවයි."[23]



"සිංහල සාහිත්‍ය නැගීම" කෘතිය රචනා කරන මාර්ටින් වික්‍රමසිංහ පාලි රීතිය මුල් කොටගෙන සැකසුණු දේශීය භාෂා රීතියක් අමාවතුරේ විද්‍යමාන වන බව ප්‍රකාශ කරයි.

"බෞද්ධ සංස්කෘතියට ද බෞද්ධ රටක පරිසරයට ද ගැළපෙන්නේ වාග් ප්‍රපංඤ්චයෙන් හා අලංකාරයෙන් දූෂණය වුණු සංස්කෘත රීතියක් නොව පාලි රීතිය ය. එහෙයින් පාලි රීතිය ගුරු කොටගත් ගුරුළුගෝමීහු අතින් හැඩගැසුණු දේශීය මාර්ගයක් ලෙස සැලකිය යුතු අමාවතුර රීතිය නවීන කවර බසක වුවද උසස් සරල රීතියට දෙවන නොවන්නකි".[24]

ත්‍රිපිටකය, අට්ඨකථා ආදී වූ පාලි මූලාශ්‍රවල කථාවස්තු තෝරාගෙන එම පාලි පාඨ පරිවර්තනය කරමින් අමාවතුර රචනා කළ නිසා පාලියේ විද්‍යමාන සරල වාක්‍ය රටාව අමාවතුරේ විද්‍යමාන වන බව ඇතැම් විද්වතුන්ගේ පිළිගැනීමයි. නමුත් හෙළ වහර යොදාගෙන රචනා කළ අමාවතුර කියවන විට එවන් හැඟීමක් ඇති නොවේ. පාලි රීතියට සමාන කෙටි වාක්‍ය රටාව අමාවතුරේ දැකිය හැකිය. සරල හෙළ වහර අමාවතුර භාෂා රීතියේ ප්‍රමුඛ ලක්ෂණයකි. අමාවතුරේ එන අඟුල්මල් දමන කථාවේ දී කතුවරයා හුදු හෙළ වහර යොදාගෙන කථාව ආරම්භ කරයි.

"අඟුල්මල් සොරහු දැමූ පරිදි කිසේ ය? යත්:- කොසොල් රජහුගේ භාර්ගව නම් පුරෝහිතයා පිණිස මන්තාණී නම් බැමිණි ගැබ් ගෙණ දෙ පුතකු ප්‍රසව කළා. ඔහු මව් කුසින් නික්මෙනැ කලැ සියලු නුවරැ ආයුධ දිලින බමුණු

නික්මැ කනැත්කරු බලන්නේ සොරනකතින් උපන් බැව් දැකැ රජු කරා ගොස් දවස් ගියසේ සුව දැ යි පිළිවිත..."[25]

ගුරුළුගෝමීන් ධර්මප්‍රදීපිකාවේ දී සංස්කෘත තත්සම බහුල භාෂාව භාවිත කළ ද අමාවතුරු රචනයේ දී හෙළ බස් වහර භාවිත කිරීමට ගත් උත්සාහය කැපී පෙනෙයි. හෙළ බස් වහර අමාවතුරේ භාවිත කළ ද පොළොන්නරු යුගයේ සිංහල භාෂාවට පැවති සංස්කෘත භාෂාවේ දැඩි බලපෑම විද්‍යමාන කරමින් අඩු වශයෙන් හෝ සංස්කෘත තත්සම පද අමාවතුරේ විද්‍යමාන වේ. ඒ.වී. සුරවීර පවසන්නේ පාලි රීතිය ගුරු කොට ගත්ත ද අමාවතුරේ සංස්කෘත තත්සම රූප අඩු නැතිව යෙදී ඇති බවයි.

"අමාවතුර පාලි සූත්‍රයන්, පෙළ හා අටුවා කෘතීන් ගෙන ඒවා විමසිලි සහිතව එකට ගැලපීම මෙන් කරන ලද ද පරිවර්තනයක් වන හෙයින් එහි බසෙහි පාලි රීතිය විද්‍යමාන වීම පුදුමයක් නොවේ. එහෙත් සංස්කෘත තත්සම රූප අඩු නැතිව අමාවතුරෙහි දැකිය හැකිය."[26]

සකු වදන් මුසු හෙළ වහර අමාවතුරෙහි ද දක්නට ලැබීමෙන් පැහැදිලි වන්නේ පොළොන්නරු යුගයේ පැවති සංස්කෘත භාෂාවේ දැඩි බලපෑමෙන් මිදීමට හෙළ වහරෙන් හෙවත් සියබසින් ග්‍රන්ථ රචනා කිරීමට අදහස් කළ ද ගුරුළුගෝමීහු හට නොහැකි වූ බවයි.

"මහවිජිත නම් රජ අටඅඟෙකින් සමුපේතය. කවර අට අඟිනැ? යත් :- අභිජනායැ, අභිරූපයැ, මහත් ධන



ඇත්තේ යැ. මහත් සිවුරඟ සෙනඟ ඇත්තේ යැ. මහත් සැදැහැ ඇත්තේ යැ, බහුශ්‍රැත යැ, කී කී බසැ අර්ථ දන්නි, පණ්ඩිතයැ ව්‍යක්ත යැ අතීත අනාගත වර්තමාන අර්ථයන් සිතන්නට සමර්ත්ථයි නම් වෙයි කීසේය."[27]

සංස්කෘත තත්සම පද මෙසේ භාවිතා කළ ද හෙළ වහරට එයින් හානියක් වන ලෙස සකු වහර භාවිතා කළ බව නො පෙනෙයි. එය ගුරුළුගෝමීන්ගේ අමාවතුර භාෂා රීතියෙහි විද්‍යමාන සුවිශේෂී ලක්ෂණයකි.

පොළොන්නරු යුගයේ අනෙක් සිංහල ගද්‍ය ග්‍රන්ථ රචකයා වූ විද්‍යාචක්‍රවර්තීන් බුත්සරණ රචනා කරමින් ඔහුටම ආවේණික වූ භාෂා රීතියක් යොදා ගන්නා අයුරු අධ්‍යයනය කළ හැකිය. බොහෝ විට බුත්සරණ රචනයේ දී සංස්කෘත භාෂා රීතියට ඔහු අනුගත වෙයි. මාර්ටින් වික්‍රමසිංහ ප්‍රකාශ කරන ආකාරයට විද්‍යාචක්‍රවර්ති නිස්සාර සංස්කෘතයට යට වූ ගද්‍ය රචකයෙකි.

"බුත්සරණ රීතිය බැවහැර බසට හුරුවන සේ සකස් කිරීම ගැන විද්‍යා චක්‍රවර්තිහු පැසසුම් ලැබිය යුතුය. එහෙත් අමාවතුරෙහි දක්නට ලැබෙන දේශීය මාර්ගය සම්පූර්ණයෙන් බැහැර කොට ඔහු නිස්සාර සංස්කෘත රීතියට වහල් වූයේ ඇස් වෙහෙසන තද පාඨත්, බර පදත් මහත් කොට සැලකුවකු නිසා විය යුතුය".[28]

බුද්ධ භක්තිය හෙවත් බුදුන්ගේ ශ්‍රේෂ්ටත්වය ශ්‍රෝතෘ ජනයා තුළ දැනවීමට බුදුන්ගේ ගුණ වර්ණනා කරන සැම

විටම පාහේ සංස්කෘත රීතිය ප්‍රබල ලෙස කතුවරයා යොදා ගනියි.

"සටනතභද්‍ර - ශාක්‍යසිංහ - පරදුඃඛදුඃඛිත ධර්මගංගාප්‍රවාහ - කරුණානිධාන - හෘදයා නන්දකර - මාරභුඞකාරසංහාර - ශරණාගතවජ්‍රපඤ්ජර - ත්‍රිභුවනචන්ද්‍ර - අභිධර්ඣමෘතප්‍රසව - දෙවාති දෙව - ශක්‍රාතිශක්‍ර - බ්‍රහ්මාතිබ්‍රහ්ම යනාදි වූ ජයකාහළ පිඹැ ගෙණැ බස්නා වූ දේවතාවෝ කෙතෙක් ද? දවල්හි දූ ආකාශයෙහි තරු පිපී ගියේ. භූමියෙහි සත් රුවන් ඉපිලැ ගියේ."[29]

"... අඥානයන්ට ප්‍රඥෞෂධ වූ, දුඃඛිතයන්ට පරමානත වූ, සංසාර ගතයන්ට නිස්සරණ වූ, දුර්දන්තයන්ට විනයමූර්ති වූ, ශොකීන්ට හෘදයාග්වාසකමන්ත්‍ර වූ, දුඃඛවාෂ්පයට අවග්‍රහනිදාඝ වූ, සන්තොෂවාෂ්පයට ඝනාගම වූ තමන් නො පහළ තෙනැ නිවන් නො පහළ වන, තමන් පහළ තැන අදහම නො පහළ වන, තමන් මුසු කෙනෙකැ සසරවැ සත් නුමුසු කරවන, බුදු පරපුරෙන් ආ නුවණින්, බුදු පරපුරෙන් ආ කුළුණින්, බුදු පරපුරෙන් ආ වැරසරින්, බුදු පරපුරෙන් ආ මැදහතින්, බුදු පරපුරෙන් ආ නොපමාවෙන්, බුදු පරපුරෙන් ආ බොධ්‍යඞගයෙන්, බුදු පරපුරෙන් ආ පරාක්‍රමයෙන්, සම්පූර්ණ වු කීවක් මැ බස් වන, කළාක් මැ කට යුතු වන, හෘදයානන්දකර වු, නයනානන්දකර වු පරමාචාර්යය වූ බුදුන් සරණ යෙමි යි බුදුසරණ යා යුතු යි."[30]

බුදුන්ගේ ගුණ වර්ණනා කිරීමේ දී උන්වහන්සේගේ ගුණ වර්ණිත වදන් මාලාවක් යොදා ගන්නා විද්‍යාචක්‍රවර්තීහු එහිදී සංස්කෘත රීතිය ගුරු කොට ගත්හ. ඊට අමතරව



බොහෝ අවස්ථාවල දී ශ්‍රෝතෘ ජනයා උදෙසා ලියවෙන බුත්සරණ කර්ණරසායනය දන්නා සංස්කෘත රීතිය බොහෝ දුරට වහල් කර ගනියි.

බුත්සරණ කතුවරයා ඇතැම් විට පාලි පාඨ පරිවර්තනයට යොමුව ඇතත් නිර්මාණාත්මක රචනා රීතියක් සෑම විටම භාවිතා කළේය. කතුවරයාගේ නිර්මාණාත්මක භාෂාව මගින් ඔහු සතුව පැවති භාෂා ශක්‍යතාව පැහැදිලි වෙයි. ඇතැම් විට විද්වතුන් විද්‍යාචක්‍රවර්තීන් සංස්කෘතයට ගැති වූ බව දුන් වුව ද බුද්ධ භක්තිය දනවීම සඳහා බුදු ගුණ පිළිබඳ ශ්‍රෝතෘ ජනයාට දනවීමට උචිත බසක් ලෙස යොදා ගත් බව සිතිය හැකි ය.

සිංහල ගද්‍ය සාහිත්‍යයේ කැපී පෙනෙන විශිෂ්ට ගද්‍ය රචකයන් දෙදෙනෙකු වූ ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් දෙදෙනා අතුරින් ගුරුළුගෝමීන්ගේ ගද්‍ය භාෂාවේ විද්‍යමාන ප්‍රධාන ලක්ෂණය වන්නේ භාෂාවේ සරල බව හා වර්ණනාත්මක බවින් තොර වීමයි. බුත්සරණ රචනා කරන විද්‍යාචක්‍රවර්තීහු ගුරුළුගෝමීන්ගේ භාෂා රීතියට වෙනස්ව යමින් සංක්ෂිප්ත රීතිය වෙනුවට දීර්ඝ රීතිය හෙවත් වර්ණනාත්මක රීතිය යොදා ගනියි. ශ්‍රෝතෘ ජනයාගේ අවධානය දිනා ගැනීමට වර්ණනාත්මක භාෂා රීතිය යොදා ගන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. අමාවතුර කතුවරයා හා බුත්සරණ කතුවරයා එකම කථා වස්තුව ඉදිරිපත් කරන ආකාරය සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමෙන් මෙය වඩාත් හොඳින් අවබෝධ කර ගත හැකිය. අංගුලිමාල දමන

කථාවේ දී බුදුන් අංගුලිමාලට පිහිටවීමට යන අවස්ථාව ගුරුළුගෝමීන් කෙටි රීතියත් විද්‍යාචක්‍රවර්තීන් දීර්ඝ රීතියත් යොදා ගනිමින් ඉදිරිපත් කරන්නේ මෙසේය.

අමාවතුර - එදවස් බුදුහු දෙව්රමින් වෙසෙමින් අලුයම් සමයෙහි ලෝ බලන්නාහු අගුල්මල් සොරහු දක "මා ගිය කලැ ඔහුට සෙත් වෙයි. .... ගම් නැති තැන මහවල්හි සිටිසේ සිවුපද ගයක් අසා මා කෙරෙහි පැවිජි ව රාත් වෙයි. ඉදින් නො ගියෙම් නම්, මව මරා සසරින් නො නැඟින හැකි වෙයි."[31]

බුත්සරණ - බුදුහු එදවස් අලුයම් වේලෙහි මහාකරුණා සමාපත්තියෙන් නැගී "අද මාගේ සද්ධර්මය අසා අමාමහානිවන් දක්නට සුදුස්සෝ කවුරුදෝ හො"යි සියලු ලොව නුවණැසින් බලා අංගුලිමාලයා දැකැ, අද මට ඒ සොරු කරා නො ගියෙම් නම්, හෙතෙම තමා රක්නට ගිය මැතියනුදු මරා ඇඟිලි කපා ගෙණැ. බුදු දහසකුදු ගලවා ගත නො හැකි පරිද්දෙන් අවීචියෙහි හී නස්නේ යැ." [32]

බුත්සරණ කතුවරයාගේ භාෂා රීතියේ දැකිය හැකි තවත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ උපමා අලංකාරයෙන් පොහොසත් භාෂාවක් යොදා ගැනීමයි. එමගින් අවස්ථා හා සිද්ධි සජීවී ලෙස පාඨකයා හමුවට ගෙනඑයි. උපමා දැක්වීමේ දී උපමාවලී භාවිතය කතුවරයා



අතින් සිදු වේ. නාලාගිරි දමනයේ දී නාලාගිරි ඇතාගේ ස්වභාවය කතුවරයා මැනවින් ඉදිරිපත් කරයි.

"එකෙණෙහි මුහුදුදියකඳ දවා ගෙණැ වඩවාමුඛයෙන් පිටත් වැ ගිය අවීචියෙහි ගිනිකඳක් සේ රළු මතැත්තෙම සොඬ හකුළුවා මහපොළොව යදඬෙකින් ගැසූ ඝණ්ඨාවක් සේ අනුරාව දෙවමින්, ගිගුරුහඬින් මුළුනුවර අසනිපාතයක් සේ තතුණුවමින්, කෝපයෙන් පය බැඳලූ යදම් ඇද ලූ කෙණෙහි මැ මකුළුහුයක් කඩන්නා සේ යදම බිඳැ සුණුවිසුණු කෙරෙමින්, හෙළුඹුදැළියක් උපුරන්නා සේ බැඳ ලූ තඹය පෙරළී සිට ඇනැ තු තු කරමින්...... දොරටු අටලු පවුරු පදනම් ඇනැ හෙළා සුණුවිසුණු කෙරෙමින් අවුත් වීථියට වැද ගියේ යැ."[33]

ගුරුළුගෝමීන් සිය ගද්‍යය ග්‍රන්ථයන්හි උපමා භාවිත කළ ද ඒ ඉතාම මඳ වශයෙනි. උපමා ආදියෙන් අලංකාර නොවීම ගුරුළුගෝමීන්ගේ භාෂාවේ ප්‍රධාන ලක්ෂණයකි. සුළු වශයෙන් හෝ උපමා භාවිතා කර ඇත්නම් ඒවා ද පාලි මූලාශ්‍රයන්ගෙන් ගත් ඒවා බව විද්වතුන්ගේ මතයයි.

"අමාවතුර රචනා ක්‍රමයේ විශේෂ ලක්ෂණයක් නම් උපමා රූපකාදී අලංකාර බහුලව නොයෙදීමයි. කලාතුරකින් යොදා ඇති උපමාවන් ඇතැම් විට කතුවරයාගේ අමුතු නිර්මාණයකි. ඇතැම් විට ඒවා පාලියෙන් ගත්තකි."[34]

ධර්මප්‍රදීපිකාව හා අමාවතුර යන කෘති දෙක තුළට ඇතැම් අවස්ථාවල කතුවරයා උපමා රූපකාදී අලංකාර

භාවිතා කරයි. අමාවතුරේ එන ආලවක දමන කතාවේ බුදුන් ඉදිරියේ දී ආලවකයාගේ ස්වභාවය උපමා රූපකවලින් දක්වයි.

"අප බුදුන් පිණිස තෝ කියබර උසබරජක්හු සමීපයෙහි එදවස් උපන් වස්සක්හු වන්නෙහි. තිමදගලිත මතැත්රජක්හු සමීපයෙහි ඇත්පැටවක්හු වැන්නෙහි දිලියෙන කෙසරුසෙළෙන් හොබනා කඳට ඇති සිංහරාජයක්හු සමීපයෙහි මහලු කැණහිලක්හු වැනනෙහි. යෙළසියක් යොජුන් ගුරුළුරජක්හු සමීපයෙහි පියාබුන් කවුඩුවක්හු වැන්නෙහි. තා කට හැකි දෑයක් ඇත කරා'යි කීහු."[35]

ගුරුළුගෝමීහු ඇතැම් තැනෙක උපමා ආදිය භාවිත කළ ද බුත්සරණ කතුවරයා තරම් උසස් ලෙස උපමා භාවිතා කිරීමට සමත් නොවේ. කෙටි රීතියෙන් කිව යුතු දේ පමණක් කියමින් ග්‍රන්ථ රචනා කිරීමට යොමුවීම ගුරුළුගෝමීන්ගේ භාෂා රීතියේ ලක්ෂණය වීම මීට මේ සඳහා බලපෑ ප්‍රධාන හේතුව බව නිගමනය කළ හැකිය.

විද්‍යාචක්‍රවර්තීහු අනුප්‍රාස භාවිතය තුළින් ශබ්ද රසයෙන් යුක්තව සිය භාෂාව නිර්මාණය කර ගැනීමට සමත් වෙයි. ගුරුළුගෝමීහුද ඇතැම් තැනෙක මඳ වශයෙන් අනුප්‍රාස භාවිත කළ ද ඔහු අනුගමනය කළ සංක්ෂිප්ත රීතිය තුළ අනුප්‍රාසවත් භාෂා රීතියකට ඉඩ නොලැබුණු බව පෙනේ.

"රජ නොයෙක්වරැ" ඔහු ඇතැණියෙන් තිරු කොට ගන්නේ යි ඇතුන් දියවීය ය. ඇසණියෙන් තිරු කොට



ගන්නේ ය යි අසුන් දිවීය ය. රථැණියෙන් තිරු කොට ගන්නේ ය යි රථ දී යවීය."[36]

අංගුලිමාල දමනයේ දී අගුල්මල් සෙත්හු ඇල්ලීමට යන්නන්හට ප්‍රධානය කළ දෑ අනුප්‍රාසවත් භාෂාව යොදා ගනිමින් ගුරුළුගෝමීන් ඉදිරිපත් කරයි. ගුරුළුගෝමීන් යොදා ගත් මෙවන් අවස්ථාවල වුව ද බුත්සරණ කතුවරයා තරම් විශිෂ්ටත්වයක් දැක්වීමට සමත් නොවෙයි. විද්‍යාචක්‍රවර්තීන් විසින් අනුප්‍රාසය ඉතා අලංකාරවත් ලෙස ගද්‍යකරණයට එකතු කොට ගැනුණි. නාලාගිරි දමන කතාවේ දී චණ්ඩ නාලාගිරි ඇතාත් ශාන්ත වූ බුදුන් වහන්සේත් දෙපසින් පැමිණෙන ආකාරය දැක්වීම සඳහා අනුප්‍රාසය ඉතා සාර්ථ ලෙස යොදා ගනියි.

"ඇත ධූලීන් වැසී ගිය ඇත්රජ යැ. මැත සවණක්සන බුදුරැසින් සැදී ගිය බුදුරජානෝයැ. ඇත කොපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජ යැ. මැත කරුණායෙන් තෙත් වැ ගිය නිල්මහනෙල්පෙති පරයන ඇස් ඇති බුදුරජානෝ යැ. ඇත එබූ එබූ පයින් මහපෙළොව පළාපියන්නාසේ දිවන ඇත් රජානෝ යැ. මැත එබූ එබූ පයින් මිහිකත සනහ සනහා වඩනා බුදුරජානෝ යැ. ඇත බැලු බැලු වත් "අනේ! අනේ!" යි කියවන ඇත් රජ යැ. මැත බැලු බැලුවත් "සාධු! සාධු!" යි කියවන බුදුරජානෝ යැ."[37]

සිද්ධීන්හි සජීවී ගුණය රැක ගැනීමට අනුප්‍රාස සහිත භාෂාව ඉතා සාර්ථකව විද්‍යාචක්‍රවර්තීන් විසින් බුත්සරණ රචනයේ දී යොදා ගැනුණි.

සමස්තයක් වශයෙන් ගුරුළුගෝමීන්ගේ හා විද්‍යාචක්‍රවර්තීන්ගේ භාෂා ශෛලිය අධ්‍යයනය කරන විට පොළොන්නරු යුගයට ආවේණික පොළොන්නරු කතිකාවත ආදී සෙල්ලිපිවල විද්‍යමාන වූ සංස්කෘත බහුල රීතියේ බලපෑම පැහැදිලිවම විද්‍යමාන වෙයි. එහෙත් කතුවරුන් දෙදෙනාගේම භාෂා ශෛලියන්හි යුගාවේණික රීතියට අමතරව නිර්මාණාත්මක ලෙස යොදා ගත් ඔවුනොවුනට ආවේණික වූ පුද්ගල රීතිය ද දක්නට ලැබේ. ගුරුළුගෝමීන් ධර්මප්‍රදීපිකාවේ දී සංස්කෘත මිශ්‍ර හෙළ වහර විශාල වශයෙන් යොදා ගනියි. එමෙන්ම සකු භාෂාව පාලි භාෂාවේ බලපෑම මෙන්ම නුමුසු හෙළ වහර යොදා ගත් අවස්ථා ධර්මප්‍රදීපිකාවේ විද්‍යමාන වේ.

ගුරුළුගෝමීන් රචනා කරන අමාවතුර කෘතිය හෙළ වහරට වඩාත් නැඹුරු වීමට දරණ ප්‍රයත්නය කැපී පෙනෙයි. ත්‍රිපිටක අට්ඨකථා ආදී පාලි මූලාශ්‍රවල දැකිය හැකි පාලි පාඨ හෙළ වදන් යොදා ගනිමින් පරිවර්තනය කරන ගුරුළුගෝමීහු සිය ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට සමත් වී ඇත. හෙළ වහර ප්‍රබල වශයෙන් විද්‍යමාන වුව ද සංස්කෘත තත්සම වදන්වල බලපෑමෙන් සම්පූර්ණයෙන් මිදීමට ගුරුළුගෝමීන්හට නොහැකි වෙයි.



විද්‍යාචක්‍රවර්තීන් සංස්කෘත තත්සම වදන් බහුල භාෂා රීතියට ප්‍රමුඛ තැන දී බුත්සණ රචනා කරයි. ගුරුළුගෝමීන්ගේ භාෂා රීතියේ විද්‍යමාන නොවූ වර්ණනාත්මක භාෂාවක් විද්‍යාචක්‍රවර්තීන් යොදා ගනියි. ගුරුළුගෝමීන් සංක්ෂිප්ත භාෂා රීතිය අගය කොට සැලකුව ද විද්‍යාචක්‍රවර්තීන් විසින් විස්තරාත්මක හෙවත් වර්ණනාත්මක භාෂා රීතිය සිය කෘතිය පුරාම යොදා ගැනුණි. ගුරුළුගෝමීහු කියවා තේරුම් ගත හැකි බුද්ධිමත් ප්‍රජාවක් මුල් කරගෙන ධර්මප්‍රදීපිකාව හා අමාවතුර රචනා කරයි. එහෙයින් ඔහුගේ භාෂා ශෛලියේ විද්‍යමාන වන්නේ දෘශ්‍ය ගෝචර හෙවත් බුද්ධි ගෝචර රචනා රීතියකැයි නිගමනය කළ හැකිය. නමුත් විද්‍යාචක්‍රවර්තීන් විසින් නිවන් සාදාගනු කැමති ශ්‍රෝතෘ ජනයා මුල් කරගත් භාවාත්මක රීතිය හෙවත් ශ්‍රව්‍ය ගෝචර භාෂා ශෛලියක් බුත්සරණ රචනයේ දී යොදා ගැනුණි.

## ආන්තික සටහන්

1. වැලිවිටියේ සෝරත හිමි, (සං), අමාවතුර, ගල්කිස්ස: අභය ප්‍රකාශකයෝ, 1972, 118 පිට
2. එම, 336 පිට
3. එම, 336 පිට
4. එම, 11 පිට
5. එම, 12 පිට
6. එම, 15 පිට

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
11 NOV 2017
පුස්තකාලය

7. එම, 336 පිට

8. ඒ. ඩී. එස්. ගුනවර්ධන, ධර්මප්‍රදීපිකාව, කොළඹ: සමයවර්ධන පොත් හල (පෞද්ගලික)සමාගම, 1997, 10 පිට

9. එම, 1972, 01 පිට

10. වැලිවිටියේ සෝරත හිමි(සං), බුත්සරණ, ගල්කිස්සඃ අභය ප්‍රකාශකයෝ, 1959, 112 පිට

11. එම, 1972, 01 පිට

12. පුංචිබණ්ඩාර සන්නස්ගල , සිංහල සාහිත්‍ය වංශය, කොළඹ: ලේක්හවුස් මුද්‍රණාලය, 1960, 108 පිට

13. ඒ. වී. සුරවීර, සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය, කොළඹ: දීපනී මුද්‍රණාලය, 1963, 132 පිට

14. මාර්ටින් වික්‍රමසිංහ, සිංහල සාහිත්‍යය නැගීම, දෙහිවල: සීමාසහිත තිසර ප්‍රකාශකයෙ, 1997, 70 පිට

15. චාර්ල්ස් ගොඩකුඹුර , සිංහල සාහිත්‍යය, කොළඹඃ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1999, 50- 51 පිටු

16. එම, 1960, 106 පිට

17. එම, 1997, 28 පිට

18. එම, 24 පිට

19. එම, 45 පිට

20. එම, 45 පිට

21. එම, 257 පිට

22. එම, 1972, 01 පිට

23. එම, 1960, 110 පිට





24. එම, 1997, 67 පිට

25. එම, 1972, 88 පිට

26. එම, 1963, 23 පිට

27. එම, 1972, 69 පිට

28. එම, 1997, 70 පිට

29. එම, 1959, 113 පිට

30. එම, 30 පිට

31. එම, 1972, 170 පිට

32. එම , 1959, 79-80 පිටු

33. එම, 170, පිට

34. එම, 1963, 106 පිට

35. එම, 1972, 170 පිට

36. එම, 92 පිට

37. එම, 1959, 81 පිට